# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2113/10 - 2019 මාර්තු මස 05 වැනි අඟහරුවාදා - 2019.03.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත**

3 වැනි වගන්තිය යටතේ නියෝග

2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3 වැනි වගන්තියේ (3) උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය මංගල සමරවීර, වන මම මෙම නියෝගය මගින්;

1. 2017 දෙසැම්බර් මස 13 දිනැති අංක 2049/16 දරන අති විශේෂ ගැසට් නිවේදනයෙහි නියෝග සංශෝධනය කරමින් ;

(i) පහත දැක්වෙන නව අනු ඡේදය, මෙහි දෙවැනි ඡේදය යටතේ වන ඊ අනු ඡේදය, 2 වැනි ඡේදය යටතේ වන ඊ අනු ඡේදයට වහාම පහතින් එකතු කරනු ලැබේ.

''(උ) 1978 අංක 04 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතිය යටතේ ඇති කළ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුම්ගත ව්‍යවසායක් විසින් නිෂ්පාදනය කරනු ලැබූ සංයෝජිත වර්ගීකරණ සංකේත 8903.91.00 යටතේ වර්ගීකරණය කරන ලද විනෝද හෝ ක්‍රීඩා කටයුතු සඳහා වූ සංචාරී සහ අනෙකුත් යාත්‍රා; පදින බෝට්ටු සහ ඔරු; අතිරේක මෝටරයක් සහිත හෝ රහිත රුවල් බෝට්ටු, ඉහත සඳහන් කරන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුම් ගත ව්‍යවසායක් විසින් මෙම යාත්‍රා සහ රුවල් බෝට්ටු කුලී පදනම මත සේවා සපයන ආයතන වෙත විකිණීම''

(ii) මෙහි වන උපලේඛන II ට පසුව I වන හා II වන තීරුවල සඳහන් සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක හා සංයෝජිත වර්ගීකරණ සංකේතාංක යටතේ ඊට අනුරූපව III වැනි තීරුවෙහි සඳහන් වූ විස්තරය යටතේ නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ ඇතුළත් මෙහි වන උපලේඛන I එකතු කරනු ලැබේ.

2. 2018 ජුලි 11 දිනැති අංක 2079/34 දරන අති විශේෂ ගැසට් නිවේදනය සංශෝධනය කරමින්, එහි උපලේඛනයට පහතින් මෙහි දැක්වෙන III වැනි තීරුවෙහි සඳහන් වූ විස්තරය යටතේ I හා II වන තීරුවල සඳහන් සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක හා සංයෝජිත වර්ගීකරණ සංකේතාංක යටතේ දක්වා ඇති භාණ්ඩ වල ඇතුළත් උපලේඛන II එකතු කරනු ලැබේ.

3. මෙම නියෝග 2019 මාර්තු 06 දින සිට බලපැවැත් වේ.

මංගල සමරවීර,
මුදල් අමාත්‍ය.

2019 මාර්තු මස 05 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය I**

| I<br>සං.ව. ශීර්ෂය | II<br>සංයෝගීකරණ වර්ගීකරණ සංකේතය | III<br>විස්තරය | IV<br>අනුපාතය |
|---|---|---|---|
| **12.14** | | **ගුලි ආකාරයෙන් වූ හෝ නොවූ ස්වීඩස්, මැන්ගෝල්ඩස්, සත්ත්ව ආහාර මුල්, පිදුරු, ලූසෙනි (ඇල්පැල්පා), ත්‍රිපත්‍ර, සෙන්පොයින්, සත්ත්ව ආහාරයට ගන්නා බොකුටු ගෝවා (කේල්) ලූපයින්ස්, වෙවස් සහ එවැනි සත්ත්ව ආහාර නිෂ්පාදන.** | |
| | | | |
| | 1214.10 | ලූසෙනි (ඇල්පැල්පා) ඇඹරූ පිටි සහ ගුලි | නිදහස් |
| | | | |
| | | | |
| **49.02** | | **ප්‍රචාරක දැන්වීම් හෝ නිදර්ශන සහිත හෝ රහිත ප්‍රවෘත්ති පත්‍ර, සඟරා, සහ කාලීන ප්‍රකාශන.** | |
| | | | |
| | 4902.10 | සතියකට අඩු වශයෙන් සතර වරක්වත් පළ කෙරෙන ඃ | |
| | 4902.10.11 | තුරඟ තරඟ හෝ ග්‍රේහවුන්ඩ් සුනඛ තරඟ (Gereyhound) හෝ තරඟ උත්සව පිළිබඳ තොරතුරු අඩංගු ප්‍රකාශන | නිදහස් |
| | 4902.10.19 | වෙනත් | නිදහස් |
| | 4902.10.91 | තුරඟ තරඟ හෝ ග්‍රේහවුන්ඩ් සුනඛ තරඟ (Gereyhound) හෝ තරඟ උත්සව පිළිබඳ තොරතුරු අඩංගු ප්‍රකාශන | නිදහස් |
| | 4902.10.99 | වෙනත් | නිදහස් |
| | 4902.90.11 | තුරඟ තරඟ හෝ ග්‍රේහවුන්ඩ් සුනඛ තරඟ (Gereyhound) හෝ තරඟ උත්සව පිළිබඳ තොරතුරු අඩංගු ප්‍රකාශන | නිදහස් |
| | 4902.90.19 | වෙනත් | නිදහස් |
| | 4902.90.91 | තුරඟ තරඟ හෝ ග්‍රේහවුන්ඩ් සුනඛ තරඟ (Gereyhound) හෝ තරඟ උත්සව පිළිබඳ තොරතුරු අඩංගු ප්‍රකාශන | නිදහස් |
| | 4902.90.99 | වෙනත් | නිදහස් |
| | | | |
| **84.64** | | **ගල්, පිඟන් මැටි, කොන්ක්‍රීට්, ඇස්බැස්ටෝස් - සිමෙන්ති හෝ සමාන ඛණිජ ද්‍රව්‍ය වැඩ කිරීම සඳහා හෝ වීදුරු සිසිලෙන් වැඩ කිරීම සඳහා යන්ත්‍රෝපකරණ.** | |
| | | | |
| | 8464.10 | ඉරීමේ යන්ත්‍ර ඃ | නිදහස් |
| | 8464.20 | ඇඹරුම් හෝ ඔප දැමීමේ යන්ත්‍ර ඃ | නිදහස් |
| | 8464.90 | අනෙකුත් ඃ | නිදහස් |

**උපලේඛනය II**

| I<br>සං.ව. ශීර්ෂය | II<br>සංයෝගීකරණ වර්ගීකරණ සංකේතය | III<br>විස්තරය | IV<br>සහනදායී අනුපාතය |
|---|---|---|---|
| **07.12** | | **සම්පූර්ණයෙන් කැපූ, පෙති ගැසූ, කැබලි කළ හෝ කුඩු කළ, එහෙත් වෙනත් ලෙසකින් සකස් නොකළ වියළි එළවළු වර්ග.** | |
| | 0712.20 | ලූනු | 2.5% |
| | 0712.90 | අනෙකුත් එළවළු : මිශ්‍ර එළවළු | |
| | 0712.90.10 | සුදු ලූනු | 2.5% |
| | | | |
| **29.03** | | **හයිඩ්‍රොකාබන් වර්ගවල හැලජනීය ව්‍යුත්පන්නයන්.** | |
| | 2903.39 | අනෙකුත් : | |
| | 2903.39.11 | ට්‍රයිෆ්ලෝරෝමීතෙන් (HFC - 23) | 2.5% |
| | 2903.39.12 | ඩයිෆ්ලෝරොමීතේන් (HFC - 32) | 2.5% |
| | 2903.39.13 | ෆ්ලෝරෝමීතේන් (HFC - 41), 1,2 - ඩයිෆ්ලෝරෝඊතේන් (HFC - 152) සහ 1,1- ඩයිෆලෝරෝඊතේන (HFC - 152 a) | 2.5% |
| | 2903.39.14 | පෙන්ටාෆ්ලොරෝ ඊතේන් (HFC - 125), 1,1, 1-ට්‍රයිෆ්ලෝරෝ ඊතේන් (HFC - 143 ac) සහ 1,1,2 - ට්‍රයිෆ්ලෝරෝඊතේන් (HFC - 143) | 2.5% |
| | 2903.39.15 | 1,1, 1 2- ටෙට්රෆ්ලෝරෝ ඊතේන් (HFC - 143 a) සහ 1,1,2 - ටෙට්රෆ්ලෝරෝඊතේන් (HFC - 134) | 2.5% |
| | 2903.39.16 | 1,1,1,2,3,3, 3 - හෙප්ටාරෆ්ලෝරෝප්‍රොපේන් (HFC - 227ea), 1,1,1,2,2,3 - හෙක්සාෆ්ලෝරෝප්‍රොපේන් (HFC - 236cb), 1,1,1,2,3, 3 - හෙක්සාරලෝප්‍රොපේන් (HFC - 236ea) සහ 1,1,1,3,3, 3 - හෙක්සාෆ්ලෝරෝප්‍රොපේන් (HFC - 236fa) | 2.5% |
| | 2903.39.17 | 1,1,1,3,3 - පෙන්ටාෆ්ලෝරෝප්රො පේන් (HFC - 245fa), සහ 1,1,2,2,3 - පෙන්ටාෆ්ලෝරෝප්රො පේන් (HFC - 245ca) | 2.5% |
| | 2903.39.18 | 1,1,1,3,3 - පෙන්ටාෆ්ලෝරෝබියුටේන් (HFC - 365mfc), සහ 1,1,1,2,2,3,4,5,5,5 - ඩෙකාෆ්ලෝරෝපෙන්ටේන් (HFC - 43 - 10mee) | 2.5% |
| | 2903.39.19 | වෙනත් | 2.5% |
| | 2903.39.21 | 2,3,3, ටෙට්රාෆ්ලොරෝප්‍රො පීන්) (HFO - 1234yf) 1,3,3,3 ටෙට්රාෆ්ලොරෝප්‍රොපීන් (HFO - 1234ze) සහ (z) - 1,1,1,4,4 4 - හෙක්සාෆ්ලොරො - 2 බියුටීන් (HFO - 1336mzz) | 2.5% |
| | 2903.39.29 | වෙනත් | 2.5% |
| | 2903.39.31 | මෙතිල් බ්‍රෝමයිඩ් (මොමීතේන්බ්‍රො) | 2.5% |
| | 2903.39.39 | වෙනත් | 2.5% |
| **78.01** | | **අසිද්ධ (පන නොපෙවූ) ඊයම්.** | |
| | | | |
| | 7801.10 | ශුද්ධ කළ ඊයම | 2.5% |

**උපලේඛනය II** (සම්බන්ධිතයි)

| *I*<br>*සං.ව. ශීර්ෂය* | *II*<br>*සංයෝගීකරණ වර්ගීකරණ සංකේතය* | *III*<br>*විස්තරය* | *IV*<br>*සහනදායී අනුපාතය* |
|---|---|---|---|
| **84.50** | | **සේදීම සහ වේලීම දෙකම කරන යන්ත්‍ර ඇතුළුව, ගෘහස්ථ හෝ ලොණ්ඩරි වර්ගයේ රෙදි සෝදන යන්ත්‍ර.** | |
| | 8450.90.10 | වෙනත් උපාංග සහිත හෝ රහිත රෙදි සෝදන යන්ත්‍රවල කැබිනට්ටු | 2.5% |

04 - 52

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.